# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

**No:** 24/2, 28th Lane, Off Flower Road, Colombo 07
**Tel:** +94 11 2565304 – 6, 5552746, 5552749, **Fax:** +94 114714460
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cpalanka.org


## ඌව පළාත් සභා මැතිවරණය - 2014

### මාධ්‍ය නිවේදන අංක - 01

**18.00 පැය, 2014-08-26, කොළඹ.**

කඩින්කඩ පවත්වන ලද පළාත් සභා ඡන්ද විමසීම් මාලාවේ අවසන් ඡන්ද විමසීම ලෙස පැවැත්වීමට නියමිත ඌව පළාත් සභා ඡන්ද විමසීම 2014 සැප්තැම්බර් මස 20 වැනි දින සෙනසුරාදා පැවැත්වීමට නියමිතය. 2014 ජූලි මස 11 වැනි දින ප්‍රකාශිත අංක 1870/64 දරණ ගැසට් නිවේදනය යටතේ ඌව පළාත් සභාව විසුරුවා හරිනලද අතර අභිනව පළාත් සභාවට තෝරාගන්නා මන්ත්‍රීවරුන් සංඛ්‍යාව මැතිවරණ කොමසාරිස්වරයා විසින් තමන්හට පළාත් සභා මැතිවරණ පනත යටතේ පැවරී ඇති බලතල අනුව සංශෝධනයට ලක් කරන ලදි. ඒ අනුව බදුල්ල හා මොනරාගල යන දිස්ත්‍රික්ක දෙක සඳහා තෝරාපත්කර ගැනීමට නියමිත මන්ත්‍රීවරුන් සංඛ්‍යාව පිළිවෙලින් 18ක් හා 14කි. මේ අතර මෙම ඡන්ද විමසීමට අදාළ තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දින වනුයේ 2014 සැප්. මස 04 හා 05 යන දින දෙකයි. ඒ අනුව බදුල්ල හා මොනරාගල යන දිස්ත්‍රික්ක දෙකෙහිම 30,699 ක පමණ රජයේ සේවකයින් පිරිසක් තැපැල් ඡන්දය භාවිතා කිරීම සඳහා සුදුසුකම් ලබා ඇත. තැපැල් ඡන්ද භාවිතා කිරීම සඳහා වු අයදුම්පත් ලබාගැනීමේ කාලසීමාව අගොස්තු මස 18 වැනි දිනෙන් අවසන් වු අතර එහි විශේෂත්වය වුයේ 42,037 ක් පමණ වු මුළු තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රමාණයක් අතරින් 11,380 ක් පමණ වු සංඛ්‍යාවක් එනම් 27% ක පමණ ප්‍රතිශතයක අයදුම්පත් ප්‍රමාණයක් ප්‍රතික්ෂේප වී තිබීමයි. නියමිත ආකාරයට අයදුම්පත් සම්පූර්ණ කර නොතිබීම හා නියමිත දිනට එම අයදුම්පත් මැතිවරණ කාර්යාලයට යවා නොතිබීම යන ආදිය මෙසේ ප්‍රතික්ෂේප වීමට හේතුපාදක වු මූලික කරුණුය.

2014 අගෝස්තු මස 26 වන දින සවස 6 වන විට සී.එම්.ඊ.වී වෙත මැතිවරණ නීති උල්ලංඝණය කිරීමේ සිද්ධීන්වලට අදාළ පැමිණිලි 62ක් පමණ ලැබී ඇති අතර ඉන් සිද්ධීන් 24ක් පමණ තහවුරු කර ගැනීමට හැකියාව ලැබී ඇත. ඒ අතරින් සිද්ධීන් 12 ක් පමණ බරපතල ඝනයේ සිද්ධි ලෙස සැලකිය හැකි ඒවාය.

නාමයෝජනා පත්‍ර භාරදීමෙන් අනතුරුව ගෙවී ගිය දින 20 ක පමණ කාලසීමාව තුළ වාර්තා වී ඇති මෙම සිද්ධීන් ප්‍රමාණය පිළිබඳව සැලකිලිමත් වීමේදී පැහැදිලිවන මූලික කරුණක් වන්නේ පසුගිය කාලසීමාවේ පැවති පළාත් සභා මැතිවරණ හා සසඳා බැලීමේදි (උතුරු ප.ස. මැතිවරණය හැර) මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවන්හී සැලකිය යුතු මට්ටමේ වර්ධනයක් සිදු වී ඇති බවයි. මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි පොලිසිය නීති විරෝධී ප්‍රචාරක පුවරු ආදිය ඉවත් කරමින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට අදාළ ප්‍රශස්ත කාර්යභාරයක් සිදු කළ ද මොනරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර හා බිබිල ආදී ප්‍රදේශ කේන්ද්‍රකරගනිමින් මතු වෙමින් පවත්නා නොසන්සුන්කාරී වාතාවරණය කෙරෙහි සියලු බළධාරීන්ගේ අවධානය වහා යොමුවිය යුතුව ඇත.

මොනරාගල දිස්ත්‍රික්කයේ පූර්ව මැතිවරණ ප්‍රචාරක ක්‍රියාවලිය, ඉතා සුළු අපේක්ෂකයන් කිහිපදෙනෙකුගේ අනිසි බලපෑමට යටත්වීම තුළ හා මැතිවරණ ප්‍රචාරක කාර්යයන්හී නිරතවීමට සියළු දේශපාලන පක්ෂ සතු අයිතියට ගරු නොකිරීම ආදී කරුණු නිසා යම් ගැටළු සහගත තත්වයකට පත් වී ඇත. දැනට තහවුරු වී ඇති පරිදි  කොළඹ ඇතුළු අනෙකුත් ප්‍රදේශවලින් විශාල සංඛ්‍යාවකින් යුත් ආධාරකරුවන් සමූහ වශයෙන් කැඳවාගැනීම මෙන්ම හදිසියේ උද්ගතවන ප්‍රචණ්ඩකාරී ක්‍රියා නිසිලෙස පාලනය කිරීමට තරම් පොලිසිය ශක්තිමත්ව ක්‍රියාකර නොතිබීම යන කරුණු හමුවේ මොනරාගල දිස්ත්‍රික්කයේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු කෙරෙහි බොහෝ විවේචන එල්ල වෙමින් පවතී. 2014 අගෝස්තු මස 23 හා 24 යන දෙදින තුළ පමණක් දේශපාලන පක්ෂ ආධාරකරුවන්ට ගිනි අවි පෙන්වා තර්ජනය කිරීමේ සිද්ධීන් ද ඇතුලත්ව දේශපාලන පක්ෂ කාර්යාල කිහිපයක්ම කඩා බිඳදැමීමේ සිද්ධීන් කිහිපයක් ම වාර්තා වු අතර එම සියලු සිද්ධීන්හිදී ප්‍රහාරයට හා තර්ජනයට ලක්වී ඇත්තේ  විපක්ෂ අපේක්ෂකයන්ට අයත් මැතිවරණ කාර්යාල හා ආධාරකරුවන්ය. මෙකී සිදුවීම් වලින් තහවුරු වන්නේ මෙම ප්‍රදේශවල හදිසි ප්‍රචණ්ඩකාරී තත්වයක් උද්ගතවී ඇති බවයි.

මෙසේ දියත් වී ඇති නොසන්සුන්කාරී තත්වය වඩාත් උත්සන්න වී ඇත්තේ යම් ආයුධ සන්නද්ධ පිරිසක් දිස්ත්‍රික්කය පුරා රාත්‍රී කාලයේ සැරිසරමින් නිදහසේ කටයුතු කරන බවට දේශපාලන පක්ෂ කිහිපයක් ම චෝදනා කරමින් සිටීමයි. එ.ජා.ප, ජ.වි.පෙ හා ප්‍ර.ප. ට අයත් මැතිවරණ කාර්යාල රාශියක් කඩා බිඳ දමන ලද්දේ මෙකී කණ්ඩායම බවට වන චෝදනාව පහසුවෙන් බැහැර කළ නොහැකිය. මේ බව ඉතා පැහැදිලි වන අවස්ථාවක් ලෙස ඊයේ (201-08-25) සිදු වූ සිදුවීම දැක්විය හැකිය. ජ.වි.පෙ අපේක්ෂක ආර්.එම්. ජයවර්ධන මහතා දැක්වූ පරිදි පසුදින එනම් 2014-08-26 ජන හමුවක් ඇමතීම සඳහා බඩල්කුඹුරට පැමිණෙන ජ.වි.පෙ. නායක අනුර කුමාර දිසානායක මහතාගේ රැස්වීමට අදාළ වේදිකාව සකසමින් සිටින අතර තුර ජ.වි.පෙ. සාමාජිකයන් හට එ.ජ.නි.ස. ආධාරකරුවන් ආරම්භයේ සිට ම බාධාකර ඇත. සැරසිලි ඉවත් කිරීම, ප්‍රදේශයේ විදුලිය විසන්ධි කිරීම වැනි ක්‍රියා කරමින් සිටි  කඩාකප්පල්කාරී ක්‍රියාවන් සඳහා හවුල් වු  පිරිස් මෙහෙයවා ඇත්තේ බඩල්කුඹුර ප්‍රා.ස. උපසභාපති කපිල සමරක්කොඩි මහතාය. එසේ බාධාකරමින් සිටි පිරිස් රාත්‍රී 10.30

ට පමණ වෙනත් ප්‍රදේශවලින් ගෙන්වා ගත් තවත් පිරිස්වල ආධාරයෙන් ජ.වි.පෙ සාමාජිකයන් හට පහරදී ඇත. ඒ සඳහා ඩිපෙන්ඩර් ජීප් රථද ඇතුලුව වාහන කිහිපයක් යොදා ගෙන ඇති අතර එම පිරිස් ටී 56 වර්ගයේ ගිනි අවියක් ද භාවිතා කරමින් අහසට වෙඩි තබා ඇත. මෙකී ප්‍රහාරයෙන් ශබ්ද විකාශන යන්ත්‍ර 6 කට ද අලාභහානි කොට ඇත. බඩල්කුඹුර පොලිසියේ කෂ්ඊ 367-216 අංකය යටතේ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමටද ජ.වි.පෙ. ක්‍රියා කර ඇත. මෙකී ගැටුමට මැදි වු පොලිස් නිළධාරීන් දෙදෙනෙක්ද බඩල්කුඹුර රෝහලට ඇතුළත් කර ඇතැයි වාර්තා වු අතර දිස්ත්‍රික් වෛද්‍ය නිළධාරී, වෛද්‍ය සුබුද්ධික කෙසෙල්කොටුව මහතා පැවසුවේ එක් පොලිස් නිළධාරියෙක් පමණක් සුළු තුවාල ලැබීම හේතුවෙන් රෝහල්ගතකර සිට පැය කිහිපයකට පසුව ප්‍රතිකාර ලබා පිටව ගිය බවයි.

එකී සිද්ධියට චෝදනා ලත් ප්‍රා.ස. උපසභාපති කපිල සමරක්කොඩි මහතා ඇමතු අවස්ථාවේදී ඔහු සියළු චෝදනා ප්‍රතික්ෂප කරමින් දැක්වූයේ තම ආධාරකරුවන් දෙදෙනෙක්ද මෙම ගැටුම නිසා තුවාල ලබා මොනරාගල රෝහලට ඇතුළත් කර ඇති බවත් එම සිද්ධිය වන අවස්ථාවේ තමන් කථානායක චමල් රාජපක්‍ෂ මහතාගේ මුලිකත්වයෙන් පැවති සාකච්ඡාවකට සහභාගී වී සිටි බවත්ය. තවද එම සිද්ධිය පිළිබඳව පොලිසියට පැමිණිලි කිරීමට ද ඔහු කටයුතු කළ බවයි.

මැතිවරණය උදෙසා පිහිටුවා ඇති මොනරාගල පොලිස් මෙහෙයුම් මැදිරියේ නිළධාරියෙකු මෙම සිදුවීම තහවුරු කරමින් අදාළ දේශපාලන පක්‍ෂ දෙක ම සිද්ධිය සම්බන්ධයෙන් පැමිණිලි කර ඇති බව ප්‍රකාශ කළේය.

මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් නගෙන චෝදනා පිළිබඳව අදහස් දක්වමින් හිටපු පළාත් ප්‍රධාන අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්‍ෂ මහතාගේ ප්‍රධාන ලේකම් රන්ජන් බණ්ඩාර මහතා සී.එම්.ඊ.වී. වෙත පැවසුවේ, තම පක්‍ෂයේ ආධාරකරුවන් හට ජ.වි.පෙ. සාමාජිකයන් පහර දී ඇති බවත් ඊට ප්‍රතිචාර ලෙස තම පක්‍ෂයේ ආධාරකරුවන් ද ඔවුන් හට පහරදී ඇති බවත්ය.





| | | |
|---|---|---|
| ආචාර්ය පී. සරවනමුත්තු | සුනිල් ජයසේකර | උදය කළුපතිරණ |
| සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු |

වැඩි විස්තර සඳහා ඃ www.cmev.wordpress.com වෙත පිවිසෙන්න